රුහුණ විශ්වවිද්‍යාලය

**2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

## SOC 22653 / SOC 2204 – ශ්‍රී ලංකාවේ මානව විද්‍යාව

ප්‍රශ්න **<u>හතරකට (04) පමණක්</u>** පිළිතුරු සපයන්න.
පැහැදිළි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතු යි.

**කාලය : පැය 03**

---

1. ශ්‍රී ලංකාවේ සමකාලීන සමාජ ගැටලු අවබෝධ කර ගැනීමෙහිලා මානව විද්‍යාත්මක දැනුම කොතෙක් දුරට අදාළ කර ගත හැකිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

2. සිංහල කුල ක්‍රමය තේරුම් ගැනීමෙහිලා බ්‍රයස් රයන්ගේ "Caste in Modern Ceylon" ග්‍රන්ථයෙහි ඇති වැදගත්කම ප්‍රමාණ කරන්න.

(ලකුණු 15 යි)

3. රැල්ෆ් පීරිස්ගේ "සිංහල සමාජ සංවිධානය: මහනුවර යුගය" - "A Sinhales Social Organization: The Kandyan Period" කෘතියෙන් නිරූපිත මහනුවර යුගයේ සමාජ සංස්ථාවන්හි ස්වභාවය සහ වර්තමාන ලාංකීය සමාජයේ එම සංස්ථාවන් හි සිදුව ඇති විපරිවර්තනය තෝරාගත් සමාජ සංස්ථා දෙකක් ඇසුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 15 යි)

4. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගමක කාලීනව සිදුව ඇති වෙනස්වීම පිළිබඳව අධ්‍යනය කරන්නෙකුට මාක්ස්වාදී මානව විද්‍යාත්මක ප්‍රවේශයන් යොදා ගැනීමේ ඇති හැකියාව පෝල් ඇලෙක්සැන්ඩර්ගේ "Sri Lankan Fishermen: Rural Capitalism and Peasant Society" අධ්‍යයනය මගින් තහවුරු වේ. විමසන්න.

(ලකුණු 15 යි)

5. "තැන්න ග්‍රාමීය ව්‍යුහය වෙනස් වීම කෙරෙහි බලපෑ පදනම් සාධකය බවට පත් වූයේ පක්ෂ දේශපාලන ක්‍රමය යි". ජොනතන් ස්පෙන්සර්ගේ "A Sinhala Village in a Time of Trouble" අධ්‍යයනය ඇසුරින් විමසන්න.

(ලකුණු 15 යි)



130

6. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගමක සමාජ ඒකාබද්ධතාවයක් පවත්වාගෙන යාමට බලපෑ සමාජීය සාධක මොනවා දැයි මාග්‍රට් රොබින්සන්ගේ "Political Structure in a Changing Sinhalese Village" අධ්‍යයනය ඇසුරින් නිදසුන් දෙමින් පැහැදිළි කරන්න.

(ලකුණු 15 යි)

7. පහත සඳහන් තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

   i. රාජකාරී ක්‍රමය
   ii. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේද
   iii. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය
   iv. වරිග සභාව
   v. ශ්‍රී ලංකාවේ මානව විද්‍යාත්මක අධ්‍යයනයන්හි මෑතකාලීන ප්‍රවණතා

(එක් පිළිතුරකට ලකුණු 05 බැගිනි)

**********************************